සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 11 S

බුද්ධ ධර්මය - I කොටස | කාලය පැය දෙකයි

නම ..............................................

උපදෙස් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න

* අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) ලෝකයේ බුදු කෙනෙකුන් උපදින බවට දෙවියන් විසින් කරනු ලබන ප්‍රකාශය හඳුන්වනු ලබන්නේ,
i. දේව වාක්‍ය නමිනි.
ii. බුද්ධ කෝලහාලය නමිනි.
iii. දේව කෝලහාලය නමිනි.

(2) "ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස" යන්නෙහි තේරුම වන්නේ
i. "මම ලොවට අග්‍රවෙමි" යන්නයි.
ii. "මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි" යන්නයි.
iii. "මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි" යන්නයි.

(3) වප් මඟුල් දිනයේ සිදුහත් කුමාරයා වැඩූ භාවනාව කුමක්ද?
i. ආනාපානසති භාවනාව
ii. මෛත්‍රී භාවනාව
iii. බුද්ධානුස්සති භාවනාව

(4) සිද්ධාර්ථ කුමාරයාගේ ගුරුවරයා වූයේ කවුද?
i. අසිත තාපසතුමා.
ii. භග්ගව තාපසතුමා.
iii. සර්වමිත්‍ර බමුණු පඬිතුමා.

(5) පස්මහ බැලුම් වලට අයත් නොවන කරුණ තෝරන්න.
i. කාලය
ii. ජාතිය
iii. කුලය

* අංක 6 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ හරිනම් ✓ ලකුණද වැරදිනම් X ලකුණද ඉදිරියෙන් තිබෙන වරහනෙහි යොදන්න.

(6) නිබ්බුත පද කීවේ කිසාගෝතමී දේවියයි. ( )

(7) බිම්බිසාර රජතුමාට පාණ්ඩව පර්වතය පාමුලදී සිදුහත් තාපසතුමාව හමුවිය. ( )

(8) සිදුහත් බෝසතාණෝ වසර 5ක් දුෂ්කර ක්‍රියා කළහ. ( )

(9) "යස්ස මූලේ නිසින්නෝව" යන ගාථාව ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කරන ගාථාවයි. ( )

(10) මෛත්‍රී භාවනාවෙන් ලැබෙන ආනිසංස ගණන 11කි. ( )

* අංක 11 සිට 15 දක්වා දී තිබෙන ප්‍රකාශ වල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(සොත්ථිය, සේනානි, දෙවුදහ, කිඹුල්වත්, ඉසිපතනාරාමයේ)

(11) මහාමායා දේවියගේ මව්පියන් වාසය කළේ ____________ නුවර ය.

(12) ලුම්බිණි සල් උයනේදී උපන් සිදුහත් කුමරු ________________ නුවරට කැඳවාගෙන ගියේ ය.



LIVEWORKSHEETS

(13) බෝසතාණන් වහන්සේ ______________ නියම් ගමෙහි තව්ස් දම් පිරූහ.

(14) පස්වග තාපසයින් සිටියේ______________ ය.

(15) බෝසතාණන් වහන්සේට කුසතණ පූජාකළේ ______________ බමුණාය.

පහත සඳහන් **A** හා B තීරු ගැලපෙන පරිදි යා කරන්න.

| A | B |
|---|---|
| 16. සිදුහත් බෝසතාණන් වහන්සේ ආසන්න පෙර භවයේ ඉපිද සිටියේ | 1. සැරියුත් තෙරුන් ය. |
| 17. බෝසතාණන් වහන්සේට මනුලොව උපදින ලෙස ආරාධනා කළේ | 2. තුසිත දෙව්ලොව ය. |
| 18. බෝසත් තුමාට හමු වූ තුන්වැනි ගුරුවරයා වූයේ | 3. උද්දකරාමපුත්ත තාපසතුමා ය. |
| 19. බුදුබව ලැබීමට පෙරදින බෝසතාණන් වහන්සේට දානය පූජාකළේ | 4. සහම්පතී මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන් ය. |
| 20. රාහුල හිමියන්ගේ ගුරුවරයා වූයේ | 5. සුජාතා සිටු දේවිය. |



LIVEWORKSHEETS